අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය - 2024

අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව 2021 සැප්තැම්බර් 08 දින එළැඹි ව්‍යාපෘති ඇගයීමේ ලේඛණයෙහි 55 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක වල ව්‍යාපෘති ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා ආරක්ෂිත කාර්යක්ෂම සහ දේශගුණයට ඔරොත්තු දෙන සම්බන්ධතාවයන් සැපයීම සහ කෘෂිකාර්මික සැපයුම් දාම ශක්තිමත් කිරීම වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 500 කට සමාන ක් රු.මිලියන 101,499.6 මූල්‍යනය කිරීමට ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟවී තිබුණි. 2023 අප්‍රේල් 19 දිනැති අංක RES 51645 ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවට අනුව, අවිනිශ්චිත සහ හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) සඳහා එ.ජ.ඩො. මිලියන 325 ක් නැවත වෙන්කිරීම හේතුවෙන් ණය මුදල රු. මිලියන 54,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 175 ක් දක්වා අඩු කරන ලදී. රු. මිලියන 300 කට සමාන එ.ජ.ඩො. මිලියන 0.97 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2021 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2026 ඔක්තෝම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

1.3 තත්ත්වාගණනය කළ මතය

මගේ වාර්තාවේ 2.1 වගන්තියේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ

තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

	ගිණුම්කරණ අඩුපාඩු	වටිනාකම රු. (මිලියන)	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 05 ක පැකේජ 12 කට අදාළව කි.මී. 268.15 ක වැඩ නිමකළ මාර්ගවල පිරිවැය රු. මිලියන 10,378.63 ක් විය. කෙසේ වෙතත්, එම වටිනාකම ව්‍යාපෘතිය විසින් ප්‍රාග්ධනීත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	10,378.63	නිම කරන ලද මාර්ග පැකේජ අවසන් ගෙවීම් (SAC) සිදුකළ පසු ප්‍රාග්ධනිත කිරීමට පියවර ගනු ලැබේ.	නිම කරන ලද මාර්ග ප්‍රාග්ධනිත කිරීම සහ නිසි ලෙස භාරදීමේ ක්‍රියා පටිපාටිය සඳහා වන නිර්ණායකයන් ප්‍රධාන ගනන්දීමේ නිලධාරීයා විසින් හඳුන්වා දිය යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අංක 4 ට අනුව, විදේශ ණය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේතුව විසින් ගෙවන ලද	13,783.26	ණය මුදලට අදාළ පොලී ණය ගිවිසුමේ සංරචකයක් ලෙස දරනු නොලබන අතර, මෙය භාණ්ඩාගාරය විසින් දරනු	අදාළ තොරතුරු භාණ්ඩාගාරයෙන් ලබා ගත යුතු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 4

	රු. මිලියන 13,783.26 ට සමාන එ.ජ. ඩොලර් මිලියන 43.20 ක පොලී ගාස්තු 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, විදේශ ණය ශේෂය සහ කෙරීගෙන යන වැඩ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.		ලැබේ.	අනුව පොලී ගාස්තු ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 4 ට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 498.25 ට සමාන එ.ජ. ඩොලර් මිලියන 1.53 ක සමුච්චිත ප්‍රයාපන ගාස්තු (commitment charges) ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ණය ශේෂය සහ කෙරීගෙන යන වැඩ ශේෂය එම ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.	498.25	ණය ගිවිසුමේ සංරචකයක් ලෙස ණයට අදාළ ප්‍රයාපන ගාස්තු දරනු නොලැබෙන අතර මෙය භාණ්ඩාගාරය විසින් දරනු ලැබේ.	අදාළ තොරතුරු භාණ්ඩාගාරයෙන් ලබා ගත යුතු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 4 අනුව ප්‍රයාපන ගාස්තු ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	2024 දෙසැම්බර් 31 වන විට සමුච්චිත පොලී සහ ප්‍රයාපන ගාස්තු පිළිවෙලින් රු. මිලියන 13,783.26 ක් සහ රු. මිලියන 498.25 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන සටහන් වල එය රු. මිලියන 5,990.75 ක් සහ රු. මිලියන 503.01 ක් ලෙස දක්වා තිබුණි. එබැවින්, ශේෂ දෙක අතර පිළිවෙලින් රු. මිලියන 7,792.51 ක සහ රු. මිලියන 4.76 ක වෙනස්කම් විය.	පොලිය 13,783.26 ප්‍රයාපන ගාස්තු 498.25	2023 දෙසැම්බර් 31 දිනට පොලී ගාස්තු සහ 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රයාපන ගාස්තු පිළිබඳ තොරතුරු භාණ්ඩාගාරය විසින් සපයන ලදී. එමනිසා 2023 දෙසැම්බර් 31 දක්වා පමණක් පොලී ගාස්තු අනාවරණය කර ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ට අනුව සාධාරණ ඉදිරිපත් කිරීමක් අවශ්‍ය වේ.

2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2009 හි 02(iv) වගන්තිය.	සියලුම රාජ්‍ය ආයතනවල සියලුම රාජ්‍ය සේවකයින්ගේ පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් තහවුරු කළ යුතුය. මීට අමතරව, අතිකාල සහ නිවාඩු දින දීමනා ගෙවීම් වැනි සාමාන්‍ය රාජකාරි වේලාවන්ගෙන් අමතරව ලබා දෙන දීමනා ගෙවීම සඳහා පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් පදනමක් ලෙස භාවිතා කරන්නේ නම්, ඇඟිලි සලකුණු භාවිතා කළ යුතුය. කෙසේ වෙතත්, අතිකාල සහ නිවාඩු දින දීමනා ගෙවීම් අදාල තහවුරු කිරීම් ලබා නොගෙන, අනුමත කර සහතික කර තිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, ඉහත චක්‍රලේඛයට පටහැනිව, ඇඟිලි සලකුණු හරහා පැමිණීම් සහ පිටවීම් තහවුරු කිරීමෙන් තොරව, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයන්හි	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIU) දෙකක, ක්ෂේත්‍ර නිලධාරීන්ට අමතරව කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකු සේවයේ යොදවා ඇති බැවින්, ඇඟිලි සලකුණු ස්ථාපනය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇත.	අතිකාල ගෙවීම් සහ නිවාඩු දින දීමනා ගෙවීම් කිරීමට පෙර සහතික කිරීම් ලබා ගත යුතුය. තවද, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(සී) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන සමාලෝචනයේදී විශේෂ අවධානය යොමු කර ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය.

		කාර්ය මණ්ඩලයට අතිකාල සහ නිවාඩු දින දීමනා ලෙස රු. මිලියන 5.24 ක මුදලක් ගෙවා තිබුණි.		
(ආ)	2019 ජනවාරි 12 දිනැති අංක DMA/01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය	අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටුවක් ස්ථාපිත කළ යුතු අතර වාර්ෂිකව අවම වශයෙන් රැස්වීම් 04 ක් වත් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ආරම්භයේ සිටම කිසිදු කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි.	ඉදිරියේදී විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	චක්‍රලේඛ උපදෙස් අනුව අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතුය.
(ඇ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) වගන්තිය	ප්‍රධාන ගනන්දීමේ නිලධාරියා සහ ගනන්දීමේ නිලධාරියා විසින් සියලුම විගණන විමසුම් සඳහා නිශ්චිත කාලය තුළ පිළිතුරු සැපයීම සහතික කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කරන ලද විගණන විමසුම් දෙකක් සම්බන්ධයෙන් දින 21 සිට දින 34 දක්වා ප්‍රමාදයකින් පිළිතුරු ලබා දී ඇති බව නිරීක්ෂණය විය.	සියලුම විගණන විමසුම් සඳහා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය පිළිතුරු සපයන අතර ඒවා විගණන අංශය වෙත යොමු කර ඇත. කෙසේ වෙතත්, නියමිත කාලය තුළ සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු සපයන ලෙස ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය වෙත උපදෙස් දෙන ලදී.	ජාතික විගණන පනතේ 38(1)(ඉ) වගන්තිය ප්‍රකාරව විගණන විමසුම්වලට ප්‍රමාදයකින් තොරව පිළිතුරු දීමට පියවර ගත යුතුය.
(ඈ)	කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 9.3 වගන්තිය	ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් අවම වශයෙන් මාස දෙකකට	ව්‍යාපෘති මෙහෙයුම් කමිටු (PSC) රැස්වීම පවත්වනු ලබන්නේ කරුණු වල	චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය.

වරක්වත් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ පවත්වා ඇත්තේ රැස්වීම් 02 ක් පමණක් බව නිරීක්ෂණය විය.	ප්‍රමුඛතාවය සහ එහි අවශ්‍යතා සැලකිල්ලට ගනිමිනි. මූලික වශයෙන්, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය සුමටව ක්‍රියාත්මක වී ඇත. කෙසේ වෙතත්, 2024 මූල්‍ය වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී.

3. භෞතික කාර්ය සාධනය

3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

අරමුදල් නැවත වෙන් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය කිරීමට නියමිත ග්‍රාමීය මාර්ගවල ඇස්තමේන්තුගත දිග කි.මී. 3000 සිට කි.මී. 1000 දක්වා අඩු කර තිබුණු අතර, මුළු අරමුදල් වෙන්කිරීම් වන එ.ජ. ඩොලර් මිලියන 500 න් එ.ජ. ඩොලර් මිලියන 325 ක් හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) සඳහා වෙන් කරන ලදී. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) මාර්ග පුනරුත්ථාපනය

සංරචකය	ක්‍රියාකාරකම	2024 දෙසැම්බර් 31 දිනට		ප්‍රමාදය/විගණන නිරීක්ෂණය	ප්‍රමාදයට හේතු
		අපේක්ෂිත භෞතික කාර්යසාධනය කි.මී.	ළඟා කරගෙන ඇති කාර්යසාධනය කි.මී.		
ආරක්ෂිත සහ දේශගුණයට ඔරොත්තු දෙන ප්‍රවාහන සම්බන්ධතාව වැඩි දියුණු කිරීම	ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම	1000	819.30	සමස්ථ ව්‍යාපෘති කාලය තුළ කි.මී. 1000 ක පමණ මාර්ග පුනරුත්ථාපනයක් ව්‍යාපෘතිය ඉලක්ක කර තිබුණද, 2024 දෙසැම්බර් 31 වන විට ඉලක්ක ගත දිග කි.මී. 819.30 ක් හෙවත් සියයට 82 ක් පමණක් විය. මාර්ග	මාර්ග තෝරාගැනීමේ ප්‍රමාදයන්

පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුවලට මාර්ග ආරක්ෂාව සහතික කිරීම සඳහා වසර 03 ක කාර්ය සාධන පාදක නඩත්තුව ද ඇතුළත් වේ. වසර 05 ක් වූ ව්‍යාපෘති කාලයෙන් වසර 3 ක් ගතවී ඇතත්, ඉතිරි මාර්ග පුනරුත්ථාපනය එහි ඉලක්කයට ඇතුළත් කිරීමට ව්‍යාපෘතියට නොහැකිව තිබුණු බව නිරීක්ෂණය විය.

කළමනාකරණයේ ප්‍රතිචාරය	ක්‍රියාකාරි සැලැස්මට අනුව, 2024 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණ දිග කි.මී. 1000 ක තෝරාගැනීම් අවසන් කරන ලද අතර කි.මී. 819.30 ක් සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කරන ලදී. ඉතිරි දිග සඳහා කොන්ත්‍රාත්තු 2025 වසරේ පලමු සහ දෙවන කාර්තුව තුළ ප්‍රදානය කිරීමට ඉලක්ක කර ඇත.
විගණකගේ නිර්දේශය	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(සී) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.

(ආ) **මාර්ග පුනරුත්ථාපනය හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම**

(i) මාර්ග දිග

සංරචකය	**ක්‍රියාකාරකම**	**2024 දෙසැම්බර් 31 දිනට**		**විගණන නිරීක්ෂණය**	**ප්‍රමාදයට හේතු**
		අපේක්ෂිත භෞතික කාර්යසාධනය කි.මී.	**ළඟා කරගෙන ඇති කාර්යසාධනය කි.මී.**		
ආරක්ෂිත සහ ග්‍රාමීය මාර්ග දේශගුණයට පුනරුත්ථාපනය, ඔරොත්තු වැඩිදියුණු කිරීම දෙන ප්‍රවාහන සහ නඩත්තු		819.3	458.43	2024 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට අපේක්ෂිත මාර්ග දිගින් සියයට 56 ක් පමණක්	කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ප්‍රමාදවීම හා අසාමාන්‍ය කොන්ත්‍රාක් ප්‍රමාදය

සම්බන්ධතාව වැඩි දියුණු කිරීම	කිරීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය			කර නිම ඇති බව නිරීක්ෂණය විය. තවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මාර්ග දිග කි.මී.210 ක් ප්‍රදානය කර නොතිබුණි. එමනිසා, සමස්ත මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ව්‍යාපෘති කාල සීමාව තුළ නිම කිරීම විගණනයේදී ගැටළු සහගත විය.	

කළමනාකරණයේ ප්‍රතිචාරය ඩොලරයේ උච්චාවචනයන් සමඟ අරමුදල් හිඟය හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ මාර්ග වැඩිදියුණු කිරීම සඳහා සලකා බැලිය නොහැකි විය.

විගණකගේ නිර්දේශය ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(සී) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.

(ii) කොන්ත්‍රාත් පැකේජ

සංරචකය	ක්‍රියාකාරකම	2024 දෙසැම්බර් 31 දිනට		ප්‍රමාදය/විගණන නිරීක්ෂණය	ප්‍රමාදයට හේතු
		අපේක්ෂිත භෞතික කාර්යසාධනය පැකේජ	ළඟා කරගෙන ඇති කාර්යසාධනය පැකේජ		
ආරක්ෂිත සහ දේශගුණයට ඔරොත්තු දෙන ප්‍රවාහන සම්බන්ධතාව වැඩි දියුණු කිරීම	ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය	16	12	ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දින දක්වා සිවිල් වැඩ කොන්ත්‍රාත්තු 47 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර එයින් කොන්ත්‍රාත් 16 ක් 2024 දෙසැම්බර් 31 වන විට	කොන්ත්‍රාත්කරුවන්ගේ අකාර්යක්ෂමතාවය

සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණි. එයින් කොන්ත්‍රාත්තු 12 ක් ව්‍යාපෘතිය ආරම්භ කර වසර තුනක් ගතවීමෙන් පසු එනම් 2024 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. එම සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත්තු වලින් කොන්ත්‍රාත්තු 04 ක් පමණක් නියමිත කොන්ත්‍රාත් කාලය තුළ සම්පූර්ණ කර තිබුණු අතර ඉතිරි කොන්ත්‍රාත්තු 08 මුල් නිම කිරීමේ දිනයේ සිට දින 57 සිට දින 314 දක්වා ප්‍රමාදයකින් අවසන් කර තිබුණි. කොන්ත්‍රාත් ප්‍රමාදය හේතුවෙන් ඉහලයන මූලික පිරිවැය නිසා ව්‍යාපෘති පිරිවැය වැඩිවීමේ බලපෑම විගණනයේදී බැහැර කළ නොහැකි විය.

කළමනාකරණයේ ප්‍රතිචාරය පැවති ආර්ථික අර්බුදය, ඉන්ධන හා ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය, කොවිඩ් වසංගතය සහ අයහපත් කාලගුණික තත්ත්වය නිසා කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ වැඩසටහනට අනුව කටයුතු කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්,කාල දිගු (EOT) ඇගයීමෙන් පසු, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව කොන්ත්‍රාත්තු සඳහා කාල දිගු (EOT) ලබා දී ඇත.

විගණකගේ නිර්දේශය ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(සී) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.

(iii) පාලම්

සංරචකය	ක්‍රියාකාරකම	2024 දෙසැම්බර් 31 දිනට		ප්‍රමාදය/විගණන නිරීක්ෂණය	ප්‍රමාදයට හේතු
		අපේක්ෂිත භෞතික කාර්යසාධනය පාලම්	ළඟා කරගෙන ඇති කාර්යසාධනය පාලම්		
ආරක්ෂිත සහ දේශගුණයට ඔරොත්තු දෙන ප්‍රවාහන සම්බන්ධතාව වැඩි දියුණු කිරීම	ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය	43	0	2024 ජුනි මාස ණය නියෝජිතායතනයේ මධ්‍ය කාලීන සමාලෝචනයට අනුව, අබලන් පාලම් හදිසි අලුත්වැඩියාව සඳහා හදිසි ප්‍රතිචාර සංරචකයේ (CERC) ඉතිරිකිරීම් වලින් එ.ජ. ඩොලර් මිලියන 7.5 ක් සංරචක 1 වෙත මාරුකිරීමට තීරණය කරන ලදී. ණය නියොජිතයාතනය සමඟ එකඟ වූ ක්‍රියාමාර්ග යටතේ, සමස්ථ ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 4,258 ක් වූ පාලම් 43 කින් සමන්විත අබලන් පාලම් නිම කිරීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් ක්‍රියාකාරී සැලැස්මක් ණය නියොජිතයාතනය වෙත ඉදිරිපත් කර තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට නියමිත දින සිට මාස 05 ½ ක කාලයක් ගතවී ඇතත්, කිසිදු භෞතික ප්‍රගතියක් විගණනයට අනාවරණය වී නොතිබුණි.	කොන්ත්‍රාත් පරිපාලනයේ ප්‍රමාදය

කළමනාකරණයේ ප්‍රතිචාරය	පාලම් හඳුනා ගැනීම, තාක්ෂණික තොරතුරු එකතු කිරීම, ප්‍රමාණ පත්‍ර සකස් කිරීම සහ, පාරිසරික සහ සමාජීය බලපෑම පරීක්ෂා කර වාර්තා සකස් කිරීම දැන් සිදු වෙමින් පවතී. තවද, පාලම් හයක් සඳහා ලංසු කැඳවනු ලැබේ.
විගණකගේ නිර්දේශය	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(සී) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	ගිවිසුම් ගත කොන්ත්‍රාත් කාලය අවසන් වීමට පෙර හෝ පෙර අනුමත කළ කාලය දීර්ඝ කිරීම (EOT) අවසන්වීමට පෙර කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කිරීම සඳහා අයදුම් කළ යුතු වුවද, 2024 වසර තුළ ක්‍රියාත්මක වූ කොන්ත්‍රාත් තුනක කොන්ත්‍රාත්කරුවන් කාලය දීර්ඝ කිරීම සඳහා අයදුම් කිරීම දින 57 සිට දින 159 දක්වා ප්‍රමාදව තිබුණු බව නිරීක්ෂණය විය.	මෙම ඉල්ලීම් ඇගයීම කොන්ත්‍රාත් ඉංජිනේරුවරයා, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය (PMU) සහ විචලතා සමාලෝචන කමිටුව විසින් අදියර තුනකින් සිදු කරනු ලැබේ. සෑම අදියරකටම පුළුල් ඇගයීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවනු ඇත.	හේතු සනාථ කිරීම සඳහා නිසි ලියකියවිලි ලබා නොගෙන කාලය දීර්ඝ කිරීම අනුමත නොකළ යුතු අතර අමතර වියදම් වළක්වා ගත යුතුය.
(ආ)	ගිවිසුම් ගත කොන්ත්‍රාත් කාලය හෝ කලින් අනුමත කරන ලද කාලය දීර්ඝ කිරීම අවසන් වීමට පෙර කාලය දීර්ඝ කිරීම අනුමත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අඛණ්ඩව පැවති කොන්ත්‍රාත් 11 කදී කාලය දීර්ඝ කිරීම් අනුමත කිරීම දින 25 සිට දින 285 දක්වා ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය.	මෙම ඉල්ලීම් ඇගයීම කොන්ත්‍රාත් ඉංජිනේරුවරයා, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය (PMU) සහ විචලතා සමාලෝචන කමිටුව විසින් අදියර තුනකින් සිදු කරනු ලැබේ. සෑම අදියරකටම පුළුල් ඇගයීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවනු ඇත.	හේතු සනාථ කිරීම සඳහා නිසි ලියකියවිලි ලබා නොගෙන කාලය දීර්ඝ කිරීම අනුමත නොකළ යුතු අතර අමතර වියදම් වළක්වා ගත යුතුය.

3.3 ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ) **මාර්ග අංශයේ ආයතනික සහ ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම - (උප සංරචක 1.2)**		
උප සංරචක 1.2 යටතේ මාර්ග අංශයේ ආයතනික සහ ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම සඳහා එ.ජ. ඩොලර් මිලියන 5 ක මුදලක් වෙන් කර තිබුණි. මෙම උප සංරචකය ග්‍රාමීය ජනතාව සඳහා ප්‍රවාහන සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාමීය මාර්ග ක්‍රමානුකූලව ඒකාබද්ධ කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා උපාය මාර්ග සකස් කිරීම සඳහා සහාය වීම, මාර්ග ආරක්ෂාව ඇතුළුව මාර්ග අංශය කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු රාජ්‍ය ආයතනවල ව්‍යුහාත්මක සැකසුම සහ විධානයන් විධිමත් කිරීම සඳහා අවස්ථා හඳුනා ගැනීම සඳහා ආයතනික සැකසුම සමාලෝචනය කිරීම සහ පාලන රාමුව තුළ මාර්ග ඉදිකිරීම් සඳහා මූල්‍යකරණය සහ ග්‍රාමීය මාර්ග නඩත්තු කිරීම වැඩිදියුණු කිරීම සඳහා විවිධ යාන්ත්‍රණ ගවේෂණය කිරීම වැනි මෙම උප සංරචකයේ අරමුණු ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කර වසර 03 ක් ගතවී ඇතත් ක්‍රියාත්මක කර නොතිබුණු අතර මාර්ග අංශයේ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම සහ මාර්ග ආරක්ෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අවශ්‍ය උපදේශකයින් බඳවා ගැනීම ප්‍රසම්පාදන අදියරේ පැවතුනි.	සියලුම ක්‍රියාකාරකම් අවසන් කර ඇති අතර, අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව, අදාළ ක්‍රියාකාරකම් කෙටි කාලයක් තුළ ප්‍රදානය කිරීමටත්, නියමිත කාල රාමුව තුළ නිම කිරීමටත් සැලසුම් කර ඇත.	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය.
(ආ) **මාර්ග අංශයේ සහ ප්‍රජා ධාරිතාව වැඩි දියුණු කිරීම - උප සංරචක 1.3**		
ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 24 වගන්තිය	අදාළ ක්‍රියාකාරකම් කෙටි	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී

සහ 2023 මැයි 09 දිනැති අංක RES 51645 ව්‍යාපෘති ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාව අනුව, ව්‍යාපෘති කාලය තුල මෙම උප සංරචකය සඳහා එ.ජ. ඩොලර් මිලියන 8.75 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන විට, ව්‍යාපෘති කළමනාකරණ පිරිවැය සහ වර්ධක මෙහෙයුම් පිරිවැය හැර, තොරතුරු තාක්ෂණය සහ ඒ ආශ්‍රිත තාක්ෂණයන් ඇතුළත් කරමින් මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතා වර්ධනය, රටට විශේෂිත ඔරොත්තු දෙන සැලසුම් ප්‍රමිතීන් ආයතනිකව ශක්තිමත් කිරීම සහ සංවර්ධනය කිරීම, මාර්ග යටිතල පහසුකම් සඳහා ස්වභාවධර්මය පදනම් කරගත් විසඳුම සඳහා ඉදිකිරීම් මාර්ගෝපදේශ සහ හොඳම භාවිතයන්, දේශගුණික-ප්‍රතිරෝධී සහ මාර්ග-වත්කම් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතා වර්ධනය සහ ආයතනික ශක්තිමත් කිරීම වැනි ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සඳහා රු. මිලියන 377.5 න් රු. මිලියන 32.35 ක් පමණක් **උපයෝජනය** කර තිබුණි. කේවල උපදේශකයින් බඳවා ගැනීම, උපකරණ මිලදී ගැනීම වැනි ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, ව්‍යාපෘති කාල සීමාව තුළ උප සංරචකයේ ඉලක්ක සපුරා ගැනීම විගණනයේදී ගැටලු සහගත විය.

කාලයක් තුළ ඉදිරියේදී ප්‍රදානය කිරීමටත්, නියමිත කාල රාමුව තුළ නිම කිරීමටත් සැලසුම් කර ඇත.

සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය.

(ඇ) **සංරචක - 2 ක්‍රියාත්මක කිරීම : ගොවීන් සඳහා සැපයුම් දාමය සහ සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම**

2021 අගෝස්තු 16 දිනැති කැබිනට් සංදේශ අංක CM: 34/2021 සඳහා 2021 අගෝස්තු 16 දිනැති කැබිනට් තීරණ අංක 21/1524/319/028 අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් සකස් කර ස්ථාපිත කිරීමට නිර්දේශ කරන ලදී. මුලිකව මෙම සංරචකය සඳහා එ.ජ. ඩොලර් මිලියන 50 ක මුදලක් වෙන් කර තිබූ අතර 2023 මැයි 09 දින ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවෙන් එය එ.ජ. ඩොලර් මිලියන 15 දක්වා අඩු කරන ලදී. කෙසේ වෙතත්, ඉහත කැබිනට් පත්‍රිකාවේ නිර්දේශයන්ට පටහැනිව, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම සංරචකය ආරම්භ කර නොතිබුණි.කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

- කුඩා පරිමාණ ග්‍රාමීය කෘෂිකාර්මික එකතු කිරීමේ ස්ථානය/පසු අස්වනු මධ්‍යස්ථාන පුනරුත්ථාපනය/ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන් සහ ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධ කර ගැනීම.
- ගොවි ප්‍රජාවගේ කෘෂි සැපයුම් ප්‍රවාහනය සඳහා විදුලි සංචලන ප්‍රවාහන නියමු කටයුතු සඳහා දේශීය කර්මාන්ත සම්බන්ධ කර ගැනීම.

යෝජනාව අවසන් කිරීමේ ප්‍රමාදය 2 වන සංරචකය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයට බලපා ඇත. කෙසේ වෙතත්, කෘෂිකර්ම අමාත්‍යාංශය (MOA) වෙතින් ලැබුණු තොරතුරුවලට අනුව නව යෝජනාවක් අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. යෝජනා සම්බන්ධ අවසන් තීරණයකට පැමිණි පසු, ව්‍යාපෘති කාල සීමාව තුළ මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය පියවර ගනු ඇත.

ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(සී) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.

3.4 ඌන උපයෝජිත සම්පත්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	ව්‍යාපෘතියේ රු. මිලියන 54,000 ට සමාන එ.ජ. ඩොලර් මිලියන 175 ක මුළු ණය මුදලින් 2024 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 21,191 ක් පමණක් **උපයෝජනය** කර තිබුණු බව නිරීක්ෂණය විය. දැනට ක්‍රියාත්මක වන කොන්ත්‍රාත්තු වල මන්දගාමී ප්‍රගතිය සහ ව්‍යාපෘතියේ 2 වන සංරචකය ආරම්භ කිරීමේ ප්‍රමාදය ණය අරමුදල් **ඌන උපයෝජනයට** ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.	පැවති ආර්ථික අර්බුදය, ඉන්ධන හා ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය සහ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට තම ඉලක්ක කරා ළඟා වීමට නොහැකි විය.	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(සී) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.
(ආ)	රජය විසින් 117-2.4-58 දරන වැය විෂය මගින් විදේශ ණය යටතේ රු. මිලියන 14,504.00 ක් වෙන් කර තිබුණද, ව්‍යාපෘතිය විසින් සවිස්තරාත්මක අයවැයක් සකස් කර ඉහත ප්‍රතිපාදන භාවිතය සඳහා අනුමැතිය ලබා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂයේ වෙන් කරන ලද මුදලින් සියයට 49.91 ක් එනම් රු. මිලියන 7,239.04 ක් පමණක් **උපයෝජනය** කර ඇති අතර, අයවැය ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය.	පැවති ආර්ථික අර්බුදය, ඉන්ධන හා ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය සහ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට තම ඉලක්ක කරා ළඟා වීමට නොහැකි විය.	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(සී) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.
(ඇ)	ව්‍යාපෘතියේ අංක 73633 (SL-219) දරන විශේෂ ඩොලර් ගිණුම අනුව, ණය නියෝජිතායතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් ලෙස රු.	පැවති ආර්ථික අර්බුදය, ඉන්ධන හා ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය සහ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන්	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය. 2018 අංක 19

	මිලියන 10,298.85 ට සමාන එ.ජ. ඩොලර් මිලියන 34.05 ක මුදලක් ලබා දී තිබුණි. වසර අවසන් වන විට රු. මිලියන 4,841.53 ක් හෙවත් සියයට 47 කට සමාන එ.ජ. ඩොලර් මිලියන 16.55 ක මුදලක් භාවිතයට නොගෙන ඉතිරිව තිබුණි.	කොන්ත්‍රාත්කරුවන්ට තම ඉලක්ක කරා ළඟා වීමට නොහැකි විය.	දරන ජාතික විගණන පනතේ 38(1)(සී) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.
(ඇ)	ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන සහ සහාය සැලැස්මේ 33 වන වගන්තියට අනුව, ණය ගිවිසුම් දින සිට මාස 12 ක කාලයක් තුළ කි.මී. 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන මගින් දැනටමත් සිදු කර ඇති සුදුසුකම් ලත් වියදම් ප්‍රතිපූරණය කිරීමට ණය නියෝජිතායතනයට එකඟ විය. නියෝජිතායතනය විසින් විසින් පසුගාමී මූල්‍යකරණයක් (Retroactive financing)) ලෙස එ.ජ. ඩොලර් මිලියන 75 ක පහසුකමක් ලබා දුන්නද, ණය නියෝජිතායතන කොන්දේසිවලට අනුකූල වීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපූරණය කරන ලද්දේ එ.ජ. ඩොලර් මිලියන 10.89 කට සමාන රු. මිලියන 3,949.43 ක් හෙවත් සියයට 14.52 ක් පමණි.	කි.මී. 100 000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ සිදු කරන ලද අදාල වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා ණය නියෝජිතායතනය විසින් පසුගාමී මූල්‍යකරණය යටතේ එ.ජ ඩොලර් මිලියන 75 ක පහසුකමක් ලබා දෙන ලදී. නමුත්, මෙම පහසුකම හරහා අරමුදල් ආපසු ගෙවීම සඳහා, සියලුම ලෝක බැංකු මාර්ගෝපදේශ සම්පූර්ණයෙන්ම සපුරා තිබිය යුතු විය. කෙසේ වෙතත්, මෙම මාර්ගෝපදේශයන්ට පූර්ණ වශයෙන් අනුකූල වන පරිදි කි.මී. 100,000 වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර වගකීම් ඒ අනුව නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(සී) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 6.2.2 වගන්තියට අනුව, ජාතික තරඟකාරී ලංසු තැබීම සඳහා අවම ලංසු කාලය දින 21 ක් විය යුතුය. කෙසේ	මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු තැබීමේ ලේඛනය සංකීර්ණ නොවන අතර, වෙන් කරන ලද දින 14 ක ලංසු තැබීමේ කාලය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය. වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන්

	වෙතත්, 2023 දෙසැම්බර් 15 දින ප්‍රකාශයට පත් කරන ලද පුවත්පත් දැන්වීමට අනුව, කුලි පදනම වාහන මිලදී ගැනීම සඳහා දින 14 ක ලංසු තැබීමේ කාලයක් පමණක් ලබා දී තිබුණි.	සැපයුම්කරුවන්ට ඔවුන්ගේ ලංසු සකස් කර ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් විය. තවද, ව්‍යාපෘතිය සඳහා මෙම ප්‍රසම්පාදනයේ කඩිනම් ස්වභාවය සැලකිල්ලට ගනිමින් සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 6.2.2 වගන්තියට අනුකූලව, ලංසු තැබීමේ කාලය අඩු කළ හැකිය.	ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදයේ 29 වන වගන්තියට අනුකූලව විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ) මඩකලපුව දිස්ත්‍රික්කයේ කි.මී. 80.99 ක ග්‍රාමීය මාර්ග සඳහා කොන්ත්‍රාත්තුව

(i)	ප්‍රසම්පාදන අත්පොතේ 7.9.2 (ක) ඡේදයට අනුව, ඇගයීමේදී ලංසු මිලෙහි සාධාරණත්වය තීරණය කළ යුතුය. තවද, ලංසු මිල ගණන් සුළු වශයෙන් අඩු නම්, ලංසුකරු විසින් මිල ගණන් යටතේ වැඩ කටයුතු සිදු කිරීමට අදහස් කරන ආකාරය, ප්‍රසම්පාදන ආයතනයේ සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරන ලෙස ලංසුකරුගෙන් ඉල්ලා සිටිය යුතුය. ලංසුකරු විසින් සපයන ලද සාධාරණීකරණය/පැහැදිලි කිරීම පිළිගත නොහැකි බව ප්‍රසම්පාදන ආයතනය සිතන්නේ නම්, ඔහුගේ ලංසුව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉංජිනේරු ඇස්තමේන්තුවලට වඩා ලංසු මිල ගණන් සියයට 19.91 සිට සියයට 30.16 දක්වා අඩු වුවද, ව්‍යාපෘතිය විසින් ලංසු පිළිගෙන තිබුණි. කෙසේ වෙතත්, ආරම්භක කොන්ත්‍රාත් කාල සීමාවෙන් මාස නවයක් (සියයට 75) ගත වූ පසුවත් එම කොන්ත්‍රාත්තුවල ප්‍රගතිය සියයට 26 ත් 56 ත් අතර වූ අතර, එබැවින්, ප්‍රමාදයකින් තොරව නිම කිරීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැක.	තෝරාගත් අඩුම ඇගයීමට ලක් වූ ලංසු හඳුනාගෙන අදාළ ලංසුකරුවන්ගෙන් පැහැදිලි කිරීම් ඉල්ලා සිටියේය. මෙම පැහැදිලි කිරීම් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සමාලෝචනය කර පිළිගත හැකි බවට තීරණය කර තිබුණි. කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටි අතර දීර්ඝ කරන ලද කාලය තුළ ඉලක්ක සපුරා ගැනීමට ඔවුන් එකඟ විය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය. වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදයේ 29 වන වගන්තියට අනුකූලව විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ii)	ලංසු ලේඛනවල ලංසු ක්‍රියා පටිපාටිවල (1 කොටස) ඇගයීම් සහ සුදුසුකම් නිර්ණායක (III වගන්තිය) අනුව, ප්‍රසම්පාදන ලංසු ඇගයීමේ ක්‍රියාවලියේදී අක්‍රිය කොන්ත්‍රාත් වල ඉතිහාසය ඇගයීමට ලක් කළ යුතුය. කෙසේ වෙතත්, තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව ඔවුන්ගේ ලංසු ඇගයීම් වලදී අනෙකුත් අදාළ ව්‍යාපෘති මගින් සපයා ඇති අදාළ ලේඛන ඇගයීමට ලක් කර නොතිබුණි. එමනිසා, පෙර කොන්ත්‍රාත්තු සතුටුදායක ලෙස ඉටු කිරීමට අපොහොසත් වූ කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි.	සම්මත ප්‍රසම්පාදන ලේඛනවලට අනුකූලව ලංසු ඇගයීම සිදු කරන ලද අතර තාක්ෂණික කමිටුව සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු විසින් ලංසුකරුවන්ගේ පෙර කාර්ය සාධනය ඒ අනුව සලකා බලන ලදී. කෙසේ වෙතත්, සම්පූර්ණ නෛතික ක්‍රියාමාර්ගවලට අදාල මුදල අඩු කිරීමෙන් පසුව පවා ඔවුන්ගේ මූල්‍ය හැකියාවන් ව්‍යාපෘති අවශ්‍යතාවයන්ට අනුකූල විය.	ප්‍රසම්පාදනයේ ලංසු ඇගයීමේ ක්‍රියාවලියේදී කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත් ඉටු නොකිරීම සම්බන්ධ ඉතිහාසය ඇගයීමට ලක් කළ යුතු අතර අදාළ කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛනගත කිරීමට පියවර ගත යුතුය.

3.6 මතභේදයට තුඩුදෙන ගණුදෙණු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
ව්‍යාපෘතිය යටතේ හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) ක්‍රියාත්මක කිරීම		
(අ) 2022 මැයි 09 දිනැති භාණ්ඩාගාර ලේකම්වරයාගේ ලිපියට සහ ඒසඳහා 2022 අගෝස්තු 18 දිනැති ලෝක බැංකුවේ දේශීය අධ්‍යක්ෂවරයා විසින් යවන ලද ලිපියට අනුව, ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර සංරචකය සඳහා එ.ජ. ඩොලර් මිලියන 325 ක මුදලක් වෙන් කර තිබුණි. ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීම සහ ක්ෂණික අවශ්‍යතා සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ සමාජ ආරක්ෂාව සැපයීමෙන් සමාජ ස්ථාවරත්වය යථා	ලෝක බැංකුව 2023/04/19 දින ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාව අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, එ.ජ. ඩොලර් මිලියන 15.06 ක් ව්‍යාපෘතියට නැවත (හදිසි ප්‍රතිචාර සංරචකයයේ ඉතිරිවීම්) ප්‍රතිස්ථාපනය කිරීමට පියවර ගෙන ඇත. දැනට එය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ පවතින අතර	මූලික අරමුණුවල විෂය පථය වෙනස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතුය.

	තත්ත්වයට පත් කිරීම සඳහා අවිනිශ්චිත සහ හදිසි අවශ්‍යතා සංරචකය (CERC) අරමුදල් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ මුලික අනුමත විෂය පථයෙන් බැහැරවීම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු ණය මුදලෙහි වත්මන් වෙනස්කම්ද ඇතුළුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පියවර ගනු ලැබේ.	
(ආ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2024 ජනවාරි 19 දිනැති අංක DMS/7777/ICDP/T -1 දරන ලිපියට අනුව, ව්‍යාපෘතියේ ණය වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 500 සිට එ.ජ. ඩොලර් මිලියන 175 දක්වා අඩු කිරීමෙන් පසු, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 3.2.1 ඡේදයට අනුකූලව ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ වැටුප් ගණනය කළ යුතුය. ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාව 2023 මැයි 09 දින අනුමත කර ඇති අතර එම දිනයේ සිට ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ වැටුප් ඒ අනුව සංශෝධනය කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රතිව්‍යුහගත කිරීම අනුමත කිරීමට පෙර මූලික ණය මුදල මත සිදු කරන ලද ගණනය කිරීම් මත පදනම්ව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ සහ ඉංජිනේරුවන් තිදෙනෙකුගේ වැටුප් ගෙවා තිබුණි. එබැවින්, කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ව්‍යාපෘතිය මගින් රු.277,376 ක වැඩිපුර ගෙවීමක් සිදු කර ඇති බව නිරීක්ෂණය විය.	ව්‍යාපෘති පිරිවැය එ.ජ. ඩොලර් මිලියන 500 ක් ලෙස ප්‍රචාරය කිරීමෙන් ව්‍යාපෘතියට ප්‍රධාන කාර්ය මණ්ඩලය බඳවා ගන්නා ලද අතර ඔවුන්ගේ පත්වීම් ලිපියේ වැටුප් පරිමාණයට අනුව ඔවුන්ට ගෙවීම් කරන ලදී. කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව (MSD) වෙතින් පිළිතුර ලැබීමෙන් පසු, සංශෝධිත ණය මුදල මත පදනම්ව ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා සේවා දීර්ඝ කිරීම නිකුත් කරන ලද අතර ඒ අනුව ගෙවීම් සිදු කරන ලදී.	චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතු අතර වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටසේ XLVII පරිච්ඡේදයේ 8 වන වගන්තියට අනුකූලව විනය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා කේවල උපදේශකයින් තෝරා ගැනීම		

2007 අගෝස්තු මාසයේදී උපදේශකයින් තෝරා ගැනීම සහ රැකියා සඳහා මාර්ගෝපදේශ සහ 2014 ජූලි මාසයේදී ලෝක බැංකු ණය ගැණුම්කරුවන්ගේ මාර්ගෝපදේශ අනුව උපදේශන සේවා යනු, උපදේශන ස්වභාවයේ උපදේශකයෙකු විසින් සපයනු ලබන සේවාවන් වුවද, ව්‍යාපෘතිය අනුමත කාර්ය මණ්ඩලයට අමතරව කේවල උපදේශන යටතේ කළමනාකරණ සහකාරවරුන් 03 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර කේවල උපදේශක ගෙවීම් ලෙස 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 13.68 ක මුදලක් වැය කර තිබුණි.	ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 49 පිටුවේ "අදාළ ප්‍රසම්පාදන ක්‍රමය සහ සමාලෝචන වර්ග" වගුව 2.2 යටතේ සහ 53 පිටුවේ 2.4 "වියදම් කාණ්ඩ" වගුව යටතේ කේවල උපදේශනය සඳහන් කර ඇති අතර ඒ සඳහා ගෙවීම් වර්ධක මෙහෙයුම් පිරිවැය හරහා සිදු කර ඇත.	අනුමත කාර්ය මණ්ඩලයට අමතරව නිලධාරීන් අනුයුක්ත නොකළ යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
2021 ඔක්තෝබර් 22 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය අභිබවා යමින්, අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය යටතේ සුළු සේවකයන් 10 ක් (කාර්යාල කර්ය සහායක, රැකවරණ භාරකරු මුරකරු, කම්කරු) ව්‍යාපෘතිය විසින් බඳවා ගෙන තිබුණු අතර, ණය අරමුදල්වල වර්ධක මෙහෙයුම් පිරිවැය කාණ්ඩය යටතේ රු. මිලියන 6.02 ක මුදලක් ගෙවා තිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.4.2 වගන්තියට පටහැනිව සැපයුම්කරුවන්ගේ ලේඛනයෙන් පිටත සිටින පුද්ගලයින්ගෙන්/සමාගම්වලින් මිල ගණන් ලබාගෙන තිබුණි.	මෙම ප්‍රසම්පාදනය ආරම්භ කරන ලද්දේ කෝවිඩ්-19 වසංගතය අතරතුරය. ප්‍රසම්පාදන ඒකකය මධ්‍යම පළාතේ මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය මෙහෙයුම් සඳහා සේවා සපයන ලියාපදිංචි සහ කීර්තිමත් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමට පියවර ගෙන ඇත.	අනුමත කාර්ය මණ්ඩලයට වඩා නිලධාරීන් අනුයුක්ත නොකළ යුතුය.

3.8 පද්ධතිය සහ පාලනයන්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
ව්‍යාපෘතියේ සම්පූර්ණ කාලයම ආවරණය වන පරිදි මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික ආදී වශයෙන් වගකීම් නියම කරමින් මූල්‍ය හා භෞතික ඉලක්ක ඉස්මතු කරන පුළුල් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. නියමිත කාල සීමාව තුළ වෙන් කරන ලද සම්පත් භාවිතා කරමින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කර නොතිබුණි.	සියලුම භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුළත් පුළුල් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති අතර එය විගණන කටයුතු සඳහා ලබා ගත හැක.	ව්‍යාපෘතිය සඳහා පුළුල් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර අනුමත කිරීමට පියවර ගත යුතුය.